# මාධ්‍ය නිවේදනය

## 2017 අගෝස්තු මස 11 වන දින

කොළඹ :

**CDS ආයතනය නව කාර්යාලයකින් වැඩ අරඹයි**

කොළඹ කොටස් හුවමාරුවෙහි පූර්ණ හිමිකාරිත්වයක් සහිත සමාගමක් වන මධ්‍යම තැන්පතු ක්‍රම පුද්ගලික සමාගමෙහි (CDS) රාජගිරිය නගරයෙහි පිහිටා ඇති නව කාර්යාලය විවෘත කිරීමෙන් වැඩ ඇරඹීම පසුගිය 10 වන දින සිදු විය. M&M මධ්‍යස්ථානය පහළ මහළෙහි පිහිටි, අංක 341/5, කෝට්ටේ පාර, රාජගිරිය දරණ ස්ථානයෙහි පිහිටා ඇති මෙම පරිශ්‍රයේ කටයුතු කිරීම තුලින් අනාගතයේදී CDS ආයතනය ව්‍යාප්ත කිරීමට සහ CDS සේවාවන් පුළුල් කිරීමට හැකි වනු ඇත.

මෙහිදී ඉහත ලිපිනය සියලු ගනුදෙනු සඳහා භාවිතා වන අතර සමාගමේ වෙබ්අඩවිය (www.cds.lk), දුරකථන අංකය (+94 11 2356456), ෆැක්ස් අංකය (+94 11 2440396) යන විස්තර නොවෙනස්ව පවති. CDS විසින් දැනට ක්‍රියාත්මක කරුනු ලබන ප්‍රතිපත්තීන් හා ක්‍රියාපටිපාටීන් මෙම ලිපිනය වෙනස්වීම තුලින් වෙනස් වන්නේ නැත.

CDS ආයතනය ස්ථාපනය කරන ලද්දේ දේශීය හා විදේශීය ආයෝජකයින්ගේ සුරැකුම්පත් නිෂ්කාශනය, ගනුදෙනු සිදුකිරීම හා සුරැකුම්පත් සුරක්ෂණය ආදී විශේෂිත අරමුණු රැසක් පූරණය කිරීමේ අරමුණ පෙරදැරිවය. වර්තමානයේදී ඉහත මූලික කාරනා වලට අමතරව විද්‍යුත් මෙහෙයුම් කටයුතු, ගිණුම් සේවා, සාංගමික ක්‍රියාකාරකම් වලට අදාළ සේවා හා ගනුදෙනු කරුවන්ට අදාළ නිෂකාෂණ හා බේරුම්කරණ සේවාද සිදුකරනු ලබන්නේ CDS ආයතනය නොකඩවා සිදු කරන ලද තාක්ෂණික වර්ධනයන්, නව්‍යතාවයන් අනුගමනය කිරීම ආදිය නිසයි .



වමේ සිට දකුණට : කොළඹ කොටස් හුවමාරුව ප්‍රධාන විධායක නිලධාරි රජීව බන්ඩාරනායක මහතා, කොළඹ කොටස් හුවමාරුව ප්‍රධාන මෙහෙයුම් නිලධාරි රේණුක විජයවර්ධන මහතා හා CDS ප්‍රධානී නලින් ෆොන්සේකා මහතා

**<u>කොළඹ කොටස් හුවමාරුව පිළිබඳව:</u>**

කොළඹ කොටස් හුවමාරුව ශ්‍රී ලංකාවේ එකම කොටස් වෙළෙඳපොළ ලෙස ක්‍රියාත්මක වන අතර එමගින් ලයිස්තුගත සමාගම් වලට හා ආයෝජකයන්ට හමුවීම සඳහා අවශ්‍ය පාරදෘශ්‍ය හා විධිමත් පරිසරය සකස් කෙරෙයි. සාමාජික ආයතන 15 කින් හා ගනුදෙනුකරන සාමාජික ආයතන 19 කින් සමන්විත මෙය ශ්‍රී ලංකාවේ නෛතික රාමුවට අදාලව ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ලියාපදිංචි කර තිබෙන අතර ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මගින් අධිකාරිය ලබා තිබේ. මෙම සියලුම සාමාජික ආයතන හා ගනුදෙනුකරන සාමාජික ආයතන කොටස් තැරැව්කරුවන් ලෙස ක්‍රියාත්මක වීමට ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිසන් සභාව මගින් බලපත්‍ර ලබාගත යුතුය. වැඩි විස්තර www.cse.lk වෙබ් අඩවියෙන් ලබාගත හැක.


**වැඩි විස්තර සඳහා අමතන්න ,**

**නිරෝෂන් විජේසුන්දර , කොළඹ කොටස් වස්තු හුවමාරුව**

**දුරකථන : + 94 112356510**

**ජංගම දුරකථන : + 94 777 819999**

**ෆැක්ස් : + 94 112445279**

**විද්‍යුත් තැපැල : niroshan@cse.lk**